**ශීර්ෂය 126 - අධ්‍යාපන අමාත්‍යාංශය**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 විගණන මතය**

**-----------------**

අධ්‍යාපන අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 27 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**--------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර, ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය..

**(ආ)** අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 වෙනත් ලැබීම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අමාත්‍යාංශයට වෙනත් ලැබීම් වශයෙන් රු. මිලියන 2,143.6 ක් ලැබී තිබුණි. ආදායම් ශිර්ෂයන් 07 ක් යටතේ රැස්කරන ලද බව සඳහන් කර තිබුණද මෙම ආදායම් ප්‍රභවයන් පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වෙනත් ආදායම් විශ්ලේෂණය කර ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතුය. | මෙම ආදායම් ශීර්ෂ සඳහා ආදායම් ගණන් දීමේ නිලධාරියා වශයෙන් අධ්‍යාපන ලේකම් කටයුතු නොකරන බැවින් විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොමැත. |

### 1.6.2 තැන්පතු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව තැන්පත් කළ දින සිට වර්ෂ 2 ක් ඉක්මවූ තැන්පතු රාජ්‍ය ආදායමට බැරකළ යුතු වුවද, වර්ෂ දෙක ඉක්මවූ රු. මිලියන 68.8 ක් වූ විවිධ තැන්පතු 5 ක් රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළයුතුය. | තැන්පත් ගිණුම්වල පවතින වසර 2 ඉක්මවූ රු.මිලියන 68.8 ක ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. |

### 1.6.3 දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණවල ශේෂය රු.මිලියන 151,170.5 ක් වූ අතර, මෙය එදිනට භෞතික ශේෂය පදනම් කරගත් වටිනාකම වූ නමුත් එය පොත්වල ශේෂ සමඟ නොගැලපුනි. | අවසන් ගිණුම්වල නිවැරදි අගයන් ගිණුම් ගත කිරීමට කටයුතු කළයුතුය. | 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපල පිරියත හා උපකරණවල අගයන් CIGAS වැඩසටහනේ Ledger ශේෂය හා BOS වාර්තාවේ ශේෂය සමාන විය යුතු වුවත්, එසේ සිදු නොවේ. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි 2018 අගෝස්තු මාසයේ දී |

| | | |
|---|---|---|
| | | සියළු වත්කම්වල අගයන් CIGAS වැඩසටහනෙන් ඉවත් කර නැවත ඇතුලත් කරන ලදී. |

**1.6.4 අත්තිකාරම් ගිණුම් ශේෂ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සැසඳුම් ප්‍රකාශය අනුව අයවිය යුතු ශේෂය රු. මිලියන 184.9 ක් වූ අතර, ඒ තුල වර්ෂ 5 කට වැඩි කාලයක සිට පැවත එන ස්ථානමාරු වී ගිය, විශ්‍රාම ගිය, මියගිය, සේවය අතහැර ගිය, වැඩ තහනම් කල හා වෙනත් සේවකයන්ගෙන් අයවිය යුතු රු. මිලියන 89.7 ක ශේෂයන් විය. සේවය හැරගිය නිලධාරීන් පිළිබඳ විස්තර ආයතන ශාඛාවේ නොතිබුණි. | හිඟ හිටි ශේෂ අයකර ගැනීමට ආයතන සංග්‍රහය හා චක්‍රෙල්බ විධිවිධාන අනුව කටයුතු කළයුතුය. | විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ අයකර ගැනීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට තොරතුරු ඉදිරිපත් කර ඇති අතර, ඇතැම් ණය ශේෂ නිරවුල් වී ඇත. |

**1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (අ) 2018 සැප්තැම්බර් 19 දිනැති අංක 2008/37 දරන අමාත්‍යාංශ චක්‍රලේඛය | චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් බඳවා ගැනීම සම්බන්යෙන් නිශ්චිත ක්‍රමවේදයක් යෝජනා කර නොතිබීම හේතුවෙන් පාසල්වල විදුහල්පතිවරුන් තමන්ට අභිමත පරිදි ලකුණු ලබාදීමේ නිර්නායක | පාසැල්වල අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් බඳවා ගැනීමේ නිශ්චිත ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කළයුතුය.<br><br>චක්‍රලේඛ විධිවිධාන අනුව ආදි ශිෂ්‍ය සංගම් ඇති කිරීම, | 2008/37 චක්‍රලේඛය මේ වන විට සංශෝධනය කරමින් පවතී. මෙහිදී අතරමැදි ශ්‍රේණිවලට සිසුන් තෝරා ගැනීමට අදාළ ව නිශ්චිත ලකුණු දීමේ ක්‍රමවේදයක් ඉදිරිපත් කිරීමට නියමිතය.<br><br>ඇතැම් පාසල්වල විදුහල්පති ආදි |

| | | | |
|---|---|---|---|
| | සකස් කරන බව විගණනයේදී නිරීක්ෂණය විය. | නිලධාරීන් පත් කිරීම හා පාසැල් වෙත සහයෝගය දැක්වීම සිදුකළ යුතුය | ශිෂ්‍ය සංගමයේ සභාපති නොවීමට අදාළ ව ශ්‍රේෂ්ඨාධිකරණ නඩු විමසීම් ඇති අතර (උදා: මලියදේව බාලිකා විද්‍යාලය - කුරුණෑගල) එම තීන්දු ලැබීමෙන් අනතුරුව මේ සඳහා කටයුතු කිරීමට නියමිතය. |
| (ආ) 1964 නොවැම්බර් 20 දිනැති අංක 1964/27 දරණ අමාත්‍යාංශ චක්‍රලේඛය සහ 1996 ජුනි 21 දිනැති ආදි ශිෂ්‍ය සංගම් ලිපිය | ආදි ශිෂ්‍ය සංගම් සභාපති වශයෙන් විදුහල්පතිවරයා පත් කරගත යුතු වුවද, එසේ පත් නොකෙරුන අවස්ථා 15 ක් පැවතුණ බව නිරීක්ෂණය විය. | අදාල උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය. | ප්‍රධාන අරමුණු දෙකක් කරණ කොට ගෙන උපදෙස් සංග්‍රහය සංශෝධනය කරන ලදි.<br>1. විගණනය, අධීක්ෂණය සහ කළමනාකරණ කටයුතුවලදී නීත්‍යානුකූල පසුබිමක් ඇති කිරීම. පුස්තකාල පොත් භාවිතයෙන් ඉවත් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම, හා උපදෙස් අනුව කටයුතු කිරීම පිළිබඳ අධීක්ෂණ සහ විමර්ෂණ සිදුකිරීම.<br>2. අපහරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක නොවන අවස්ථා ඇති හෙයින්. සැලසුම් කර ඇති පරිදි කියවීම් ප්‍රවර්ධන නිලධාරීන් බඳවා ගැනීමෙන් අනතුරුව මෙම උපදෙස් සංග්‍රහය පිළිබඳ ඔවුන්ට පුහුණුවක් ලබා දීමට නියමිත ය. |
| (ඇ) 2008 අප්‍රේල් 25 දිනැති අංක 11/2018 පාසැල් පුස්තකාල හා ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන සඳහා වූ උපදෙස් සංග්‍රහය | ඇතැම් පාසල් විසින් අදාළ උපදෙස්වලට අනුකූලව කටයුතු කර නොතිබුණු අතර, සෝදිසි විගණන පරීක්ෂාවේදී එවැනි අවස්ථා 25 ක් පැවතුණි. | විගණන විමසුම් සඳහා නියමිත කාල වකවානු තුල පිළිතුරු සැපයීමට කටයුතු කළයුතුය | 2018 හා 2019 පිළිතුරු නොලද විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු ලබා දෙන ලෙස නිලධාරීන් දැණුවත් කර ඇත. |
| (ඇ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ viii වන කොටසේ 42 වන වගන්තිය | අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද රු.මිලියන 112.2 ක් වටිනා විගණන විමසුම් 15 කට වාර්තාවේ දින වන විටත් පිළිතුරු ලබාදී නොතිබුණු අතර, | | |

එම විමසුම් නිකුත් කර මාස 01 සිට මාස 14 දක්වා කාල පරාසයක් ගත වී තිබුණි.

**1.6.6 අවිධිමත් ගණුදෙනු**

**----------------------**

පහත සඳහන් නිරීක්‍ෂණ කරනු ලැබේ.

| **විගණන නිරීක්‍ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම්** |
|---|---|---|
| **--------------------** | **-----------** | **-------------------------------------** |
| (අ) 2008 අප්‍රේල් 30 දිනැති අංක 2008/17 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛය අනුව පහසුකම් හා සේවා ගාස්තු හා පාසල් සංවර්ධන සමිති ගාස්තු හැර වෙනත් කිසිදු මුදලක් අය කළ නොහැකි වුවද, ඊට අනුකූල නොවී 2020 උසස් පෙළ සඳහා බඳවා ගත් සිසුන් 193 දෙනෙකුගෙන් රු.මිලියන 2.8 ක මුදලක් දකුණු පළාතේ ප්‍රධාන පිරිමි පාසලකින් එකතු කර තිබුණි. මෙම මුදල් පාසල් සංවර්ධන සමිති ගිණුමට බැරකර නොතිබුණු අතර, දෙමාපිය කමිටු සාමාජිකයින් නමින් බැංකු ගිණුම් වල තැන්පත් කර තිබුණි. | පවතින ලිඛිත උපදෙස් අනුව කටයුතු නොකිරීම පිළිබඳව විනය පියවර ගැනීමට කටයුතු කළයුතුය. | ජාතික පාසල් වල අයවැය ලේඛන සකස් කොට අනුමැතිය ලබාගැනීම විදුහල්පතිවරුන්ගේ වගකීම වේ. 2019.04.09 දිනැති 19/2019 හා 05/2015 චක්‍රලේඛ මගින් මුදල් අය කිරීම තහනම් කරන විධිවිධාන බලාත්මක කර ඇත. සිසුන්ගෙන් අවිධිමත් ලෙස මුදල් එකතු කිරීම සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි අනුව පොදුවේ සියලුම ජාතික පාසල් විදුහල්පතිවරුන් දැනුවත් කර ඇත. |
| (ආ) 1964 නොවැම්බර් 20 දිනැති අංක 1964/27 දරන චක්‍රලේඛය හා 1996 ජූනි 21 දිනැති ආදි ශිෂ්‍ය සංගම් ලිපිය අනුව ආදි ශිෂ්‍ය සංගම් පිහිටුවිය යුතුය. ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව පාසැල් 18 ක ආදි ශිෂ්‍ය සංගම් මගින් රු.මිලියන 129.19 ක මුදලක් 2018 වර්ෂයේදී රැස්කර තිබුණු අතර, ඉන් පාසැල් 09 ක කටයුතු වෙනුවෙන් රු.මිලියන 23.99 ක් වැයකර තිබුණි. පාසැල් 09 ක ආදි ශිෂ්‍ය සංගම්වලින් රැස්කර තිබුණු රු.මිලියන 69.93 ක් මුදලක් එම පාසැල්වල කිසිදු කටයුත්තක් | පාසැල් අරමුණු කරගෙන අරමුදල් රැස්කරන ආදි ශිෂ්‍ය සංගම් විසින් සිදුකරන පාසැල් සංවර්ධන කටයුතු අධීක්‍ෂණය කළයුතුය | (අ) ආදි ශිෂ්‍ය සංගම් මගින් පාසල්වල සුභ සාධනය හා කාර්ය සාධනය ඉහල නැංවීම සඳහා ව්‍යාපෘති සැලසුම් කර ජාතික පාසලේ විදුහල්පති විසින් ජාතික පාසල් අධ්‍යක්ෂගේ අනුමැතිය ලබාගැනීම ද සිදුවේ. මේ හැරුණු කොට ආදි ශිෂ්‍ය සංගම් මූලා කටයුතු සම්බන්ධයෙන් ජාතික පාසල් ශාඛාවේ සෘජු අධීක්ෂණයක් සිදු නොවේ. |

වෙනුවෙන් වැයකර නොතිබුණි. පාසැල් 06 ක ආදි ශිෂ්‍ය සංගම්වල රු.මිලියන 19.77 ක ස්ථාවර තැන්පතු පැවතුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| වර්ෂය වෙනුවෙන් ඉල්ලුම් කළ අග්‍රිමය රු.මිලියන 98,266.87 ක් වූ අතර, භාණ්ඩාගාරය විසින් ලබාදී තිබුණු අග්‍රිමය රු.මිලියන 64,229.22 ක් විය. මුළු ලැබීම්වල එකතුව රු.මිලියන 68,872.77 ක් වූ අතර, මුළු වියදම රු. 74,990.33 ක් වීම හේතුවෙන් වර්ෂයේ ඌණතාවය රු.මිලියන 6,117.56 ක් විය. ඒ අනුව අමාත්‍යාංශය විසින් නිසි පරිදි අග්‍රිම කළමනාකරණය සිදු කර නොතිබුණි. | නිවැරදිව සැලසුම් සකස් කිරීමට හා ඒ අනුව අග්‍රිම කළමනාකරණය කිරීමට කටයුතු කළයුතුය | ඡේදයේ කරුණු පිළිගෙන ඇත. |

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| (අ) ප්‍රාග්ධන වැය විෂයයන් 04 ක් සඳහා පරිපූරක මගින් ලබාගෙන තිබුණු රු.මිලියන 57 ක ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී තිබුණි. | පරිපූරක ඇස්තමේන්තු මගින් වෙන් කරගනු ලබන ප්‍රතිපාදන නිසි කළමනාකාරිත්වයක් ඇතිව යෙදවිය යුතුය. | නවීන ඉංග්‍රීසි ගුරු පුහුණු මධ්‍යස්ථානයේ ඉඩම පවරාගැනීමේදී ඇති වූ ගැටළු සහ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ නොකිරීම හා අවසන් නොවීම ඉතිරිවීම්වලට හේතු වී ඇත. |
| (ආ) පුනරාවර්තන වැය විෂයයන් 04 ක රු.මිලියන 4,805.1 ක ප්‍රතිපාදන සියයට 100 ක් ඉතිරිව තිබුණි. වැය විෂයයන් 9 කට අදාළව රු.මිලියන 4,652.99 ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණු අතර, ඒවා සියයට 50 සිට සියයට 99 දක්වා පරාසයක විය. | වර්ෂයේ ප්‍රතිපාදන සැලසුමකට අනුව, ඵලදායී ලෙස උපයෝජනය කළයුතුය | කලාකරුවන් සඳහා අනතුරු හා වෛද්‍ය රක්ෂණාවරණය ලබාදීම ටවර්හෝල් රඟහල පදනම සිදු කිරීම, ද්විතීය අධ්‍යාපනයට අදාළව විදේශ ගමන් සඳහා ඉල්ලීම් ඉදිරිපත් නොවීම, පරිගණක කුලී පදනම මත ලබා ගැනීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු නොවීම, රජයේ ආධාර ලබන උපකෘත පාසල්වල ගුරුභවතුන්ට ණය |

| | | | |
|---|---|---|---|
| | | | පහසුකම් ලබා දීම සඳහා අයදුම්පත් වර්ෂාවසානයට පෙර ඉදිරිපත් නොවීම, ආදී කරුණු හේතුවෙන් ප්‍රතිපාදන 100% ක් ඉතිරිව තිබුණි. |
| (ඇ) | මූලධන වියදම් ශුද්ධ වෙන්කිරීම රු.මිලියන 41,879.95 ක් වූ අතර, ඉන් වැය විෂයයන් 21 කට අදාළව රු.මිලියන 5,462 ක ප්‍රතිපාදන සියයට 100 ක් ඉතිරි වී තිබුණි. එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 ක් විය. වැය විෂයයන් 39 ක් වෙනුවෙන් වෙන්කරන ලද ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.මිලියන 10,718.1 කින් රු.මිලියන 7,342.59 ක් ඉතිරි වී තිබුණි. එය සියයට 50 සිට සියයට 99 දක්වා වූ ප්‍රතිශතයක් විය. | -එම- | ප්‍රතිපාදන 100% ක් ඉතිරිවීම්වලට හා 50% සිට 99% ක ඉතිරිවීම්වලට පුනරාවර්තන වැය විෂයයන් තුළින් ගෙවීම, අමාත්‍ය මණ්ඩල තීරණ නොලැබීම, කාර්යයන් ඉදිරි වර්ෂයට කල් තැබීම, සැලසුම් පිළිබඳ නොඑකඟතාවය, බිල්පත් ඉදිරිපත් නොකිරීම වැනි හේතු විය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම්** |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් 2018 වර්ෂය සඳහා සැලසුම් කරන ලද ක්‍රීඩා ශාඛාවේ ක්‍රියාකාරකම් 17 ක් ඇතුළු පාසැල්වල පහසුකම් ඇති කිරීම සඳහා සැලසුම් කර තිබූ විවිධ ව්‍යාපෘති 3 ක ඇස්තමේන්තුගත වටිනාකම වූ රු.මිලියන 1,738 කින් රු. මිලියන 232 ක් පමණක් වැය කර තිබුණි. | සැලසුම් අනුව ක්‍රියාකාරකම් සිදුවෙනවාද යන්න ප්‍රායෝගිකව නිරීක්ෂණය කිරීම තුළින් ඒවායේ කාර්යසාධනය මැන බැලීමට කටයුතු කළයුතුය. | අඩුපාඩු මගහරවා ගැනෙන පරිදි නියාමන ක්‍රමවේදයක් වඩාත් විධිමත් හා කාර්යක්ෂමව ඉදිරිපත් කිරීමට පියවර ගැනීමට අදාල නිළධාරීන් දැනුවත් කර ඇත. |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්‍ෂණ කරනු ලැබේ.

| **විගණන නිරීක්‍ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම්** |
| --- | --- | --- |
| **(අ) ජාතික අධ්‍යාපන ක්‍රමයක් හා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කිරීම** | | |
| i. අධ්‍යාපන අමාත්‍යාංශ කාර්යභාරය අනුව ලෝක තරඟකාරීත්වයට ආත්ම විශ්වාසයකින් හා සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතුව ප්‍රවේශ වීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීමේ කාර්යය සම්පූර්ණයෙන් ඉටු කිරීමට නොහැකි වී තිබුණි. | ශ්‍රී ලාංකීය අධ්‍යාපනය සඳහා අධ්‍යාපන ප්‍රතිපත්තියක් වර්තමානයට ගැලපෙන අයුරින් සකස් කළයුතුය. | විෂයමාලා විවිධාංගීකරණය, අවශ්‍යතාව අනුව විෂයයන් ප්‍රවර් ප්‍රමුඛතාව ලබා දිය යුතු විෂයයන් සඳහා අවශ්‍ය මානව, භෞතික හ පහසුකම් සැපයීම, 13 වසරක සහති ලද අධ්‍යාපන ප්‍රතිපත්තිය, විභාග හ ක්‍රමය පිළිබඳ ප්‍රතිසංස්කරණය, ආ ගෙන ඇත. තවදුරටත් ප්‍රව ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |
| ii. 1991 අප්‍රේල් 19 දිනැති 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ විධිවිධාන අනුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 1992, 2003 සහ 2016 වර්ෂවලදී නිර්දේශ ඉදිරිපත් කර තිබුණු නමුත් 2018 වර්ෂය අවසාන වන විටද ජාතික අධ්‍යාපන | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි. | | -එම- |
| iii. | 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ III වන පරිශිෂ්ඨයේ අධ්‍යාපනයට අදාලව 2 වන ව්‍යවස්ථාව අනුව පෙර පාසල් අධීක්ෂණය හා කළමනාකරණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශය පවරා තිබූ අතර, අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයක් වශයෙන් හඳුනාගෙන තිබුණ පෙර පාසල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම සිදු කර නොතිබුණි. | -එම- | |

**(ආ) අධ්‍යාපන ප්‍රතිසංස්කරණ**

----------------------------

| | | | |
|---|---|---|---|
| i. | 2017 කාර්යසාධන වාර්තාව අනුව ජාතික සුපරීක්ෂණ අධිකාරිය පිහිටුවා එහි අරමුණුගත කාර්යයන් සිදුකිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නොහැකි වී තිබුණි. | අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සඳහා අරමුණුගත කාර්යයන් නිශ්චිතව ඉටුකරලීම සඳහා කටයුතු කළ යුතුය. | අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කර අනුමැතීන් ලැබී තිබුණි. ඒ අනුව අධ්‍යාපන ප්‍රතිතන මණ්ඩලය පිහිටුවීමට හා කාර්ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නැවතත් අමාත්‍ය මණ්ඩල සටහනක් කෙටුම්පත් කර ගරු අධ්‍යාපන අමාත්‍යතුමා වෙත යොමු කිරීමට කටයුතු කරමින් පවතී. |
| ii. | ජාතික පාසැල් සංඛ්‍යාව ඉහල නැංවීමට අදාළ සංකල්ප පත්‍රිකාව හා තෝරාගැනීමේ නිර්නායක සකස් කිරීමට කටයුතු කල බවට තොරතුරු නොවීය. | අදාල නිර්නායක හඳුන්වා දී පවත්නා ජාතික පාසැල් උපරිම ගුණාත්මකභාවයෙන් ක්‍රියා කරවීමට අවශ්‍ය නියාමනය කළයුතුය | අමාත්‍ය මණ්ඩල සංදේශයට ලද තීරණයට අනුව සකස් කරන ලද ජාතික පාසල් ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර, ඊට ලද තීරණය අනුව නව ජාතික පාසල් පිහිටුවීම හා දැනට පළාත් සභා යටතේ ඇති රජයේ පාසල් ජාතික පාසල් ලෙස උසස් කිරීම සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තිය 2019 මැයි 09 අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. |

**(ඇ) පාසැල් ආරම්භ කිරීම හා වසාදැමීම**

2018 වර්ෂයේ සංඛ්‍යා ලේඛන වාර්තා අනුව දිස්ත්‍රික් 21 ක පාසැල් 101 ක් වසා දමා ඇති අතර එයින් 31 ක් ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොමැති වීම හේතුවෙන්ද, 45 ක් රටේ පවත්නා තත්ත්වය අනුවද, 21 ක් හේතුව වාර්තා නොවන තත්ත්වයක් යටතේද, 4 ක් අනෙකුත් හේතු යටතේද වසා දමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

i. ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොමැතිකම හේතුවෙන් වසා දමා ඇති පාසල් 31 තුල පැවති පාසල් 10 ක් පාසල් ව්‍යුහ කටයුතු පිළිබඳ උපදෙස් සංග්‍රහයේ 3.2.6 ඡේදයට අනුකූල නොවන අයුරු වසා ඇති බව නිරීක්ෂණය විය.

ii. පාසැල් 78 ක පළමු ශ්‍රේණි සඳහා 2019 වර්ෂයට අදාළව කිසිදු අයදුම්පතක් ඉදිරිපත් කර නොතිබුණි.

iii. 2018 වර්ෂය තුලදී පාසැල් 38 ක් තාවකාලිකව වසා දමා තිබුණු අතර, වසා දැමූ පාසැල්වල ලීබඩු, උපකරණ හා ගොඩනැගිලි ආදී වත්කම් සම්බන්ධයෙන් පැහැදිලි ප්‍රතිපත්තියක් නොවීය.

iv. නව පාසලක් ආරම්භ කිරීම පාසල් ව්‍යුහ කටයුතු පිළිබඳ උපදෙස් සංග්‍රහයේ 2 ඡේදය පරිදි සිදුවිය යුතු වුවද, 2018 වර්ෂයේ සංඛ්‍යා ලේඛන අනුව දිස්ත්‍රික් 14 ක අළුතින් ආරම්භ කර ඇති පාසැල් 17 සඳහා ඉහත උපදෙස් සංග්‍රහය අනුව කටයුතු කළ බව තහවුරු නොවුණි.

නව පාසැල් ආරම්භ කිරීමට මෙන්ම පාසැල් වසා දැමීම සඳහාද නිශ්චිත නිර්නායකයන් හඳුන්වාදීමට කටයුතු කළ යුතුය.

පිළිතුරු ඉදිරියේදී ඉදිරිපත් කරමි.

| | | | |
|---|---|---|---|
| **(ඇ)** | ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ජාත්‍යන්තර පාසැල් අධීක්‍ෂණය කිරීම අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණු අතරින් එකක් විය. 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25 වන වගන්තිය අනුව වයස අවුරුදු 5 ත් 14 ත් අතර වයස් සීමාවල පසුවන දරුවන්ට අධ්‍යාපනය ලබාදීම සඳහා කිසිදු පුද්ගලයෙකු විසින් පෞද්ගලික පාසැල් ආරම්භ කළ නොහැකි වුවද පනතට අනුකූල නොවන අයුරින් ජාත්‍යන්තර හා පෞද්ගලික පාසැල් ආරම්භ කර තිබුණි. | වර්තමානයේ සීඝ්‍රයෙන් බිහිවෙන පුද්ගලික හා ජාත්‍යන්තර පාසැල් පිළිබඳ විධිමත් අධීක්‍ෂණයක් සහ නියාමනයක් සිදුකිරීම අත්‍යාවශ්‍ය කරුණක් ලෙස සලකා කටයුතු කළයුතුය. | 1961 අංක 08 දරන උපකෘත පාසල් හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25(1) සඳහන් නෛතික විධිවිධාන සංශෝධනය කිරීමට 2001 වසරේ සිට අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කර ඇතත් මෙතෙක් එම විධිවිධාන නොවෙනස්ව පවතී.<br><br>අදාළ නෛතික විධිවිධාන සංශෝධනය කර අවශ්‍ය රෙගුලාසි සම්පාදනය කිරීමෙන් අනතුරුව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ජාත්‍යන්තර පාසල් අධීක්ෂණය කිරීම හා ජාත්‍යන්තර හා පෞද්ගලික පාසල් විධිමත් කිරීම සිදු කළ හැකිය. |
| **(ඉ)** | 11 වන ශ්‍රේණිය දක්වා පිරිමි සිසුන් රැඳී සිටීමේ අනුපාතය 2017 වර්ෂයේ දී සියයට 87 සිට 2018 දී එය 88 දක්වා වැඩි කිරීමේ ඉලක්කය සඳහා ක්‍රියාමාර්ග 24 ක් සැලසුම් කර තිබුණි. ඉන් ක්‍රියාමාර්ග 08 ක් ඉටුකර නොතිබුණි. | අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රියාවලිය සැලසුම් කිරීමේදී ප්‍රධාන කාර්යසාධන දර්ශක වශයෙන් හඳුනාගෙන ඇති කාර්යයන්ට ප්‍රමුඛත්වය දී කටයුතු කළයුතුය. | 2017 අයවැය යෝජනා යෝජ පරිදි, රජයේ ගුරුවැටුප් ලබන රජ අනුමත පෞද්ගලික පාසල්ව ගුරුවරුන් හට අග්‍රහාර රක්ෂ ක්‍රමයේ ප්‍රතිලාභ ලබාදීමට කටයු කරන ලදී.<br><br>අනෙකුත් ක්‍රියාමර්ග ඉටු නොකිරී පිළිබඳ පිළිතුරු ඉදිරියේදී ඉදිරිප කරමි. |

## 3.3 විදේශ ආධාර ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| දැනුම කේන්ද්‍රයෙහි පදනම ලෙස පාසැල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ඡේදයට පටහැනිව ලැප්ටොප් පරිගණක මිලදී ගෙන තිබුණි. එහිදී සැපයුම්කරුවන් විධිමත්ව තෝරා නොගැනීම හා අදාල සැපයුම්කරු සැපයුම් කොන්දේසි උල්ලංඝනය කිරීම, ගුරු වෘත්තිය සංවර්ධනයට අදාළ අත්පොත් සහ මාර්ගෝපදේශ මුද්‍රණය නොකිරීම, ඉදිකිරීම් හා අළුත්වැඩියා කටයුතු ප්‍රමාද කිරීම හා ඇස්තමේන්තු වටිනාකම තුල කටයුතු නොකිරීම යන අඩුපාඩු විය. ඉගෙනුම් ප්‍රවර්ධනයට පාසැල්වලට ලබාදෙන අවශ්‍යතා, ප්‍රමුඛතාවය අනුව හඳුනානොගැනීම හා එම ව්‍යාපෘතිය 2018 ජූනි 30 නිම වීමෙන් පසුව ඉතිරි වූ රු.මිලියන 129.27 ක මුදල සැලසුමකින් තොරව පාසැල්වලට බෙදාහැරීම යන අඩුපාඩුද විය. | විදේශ ආධාර ව්‍යාපෘතින්වල අරමුණු ලඟා කරගනිමින්, එම ආධාර කළමනාකරණය කරමින් ඵලදායීව යෙදවීමට කටයුතු කළයුතුය. | මෙම ප්‍රසම්පාදන කාර්යයන් දෙක එකතු කොට ගත් විට පරිපූරක 33 හි සඳහන් උපරිම සීමාව වන මිලියන දහ අට ඉක්මවා ඇති බව පිළිගනිමි.<br><br>ලෝක බැංකු ආධාර ව්‍යාපෘතියෙහි ගිවිසුම් කාල පරිච්ඡේදය අවසන් වන දිනය වූ 2018 ජූනි 30 ට පෙර ප්‍රසම්පාදන කාර්ය නිම කිරීම අරමුණු කර, අමාත්‍යාංශ ගබඩාවට භාණ්ඩ භාරගෙන, ප්‍රසම්පාදනය අවසන් කොට ගෙවීම් සිදුකර ඇත. පසුව භාණ්ඩ බෙදාහැරීමේදී ප්‍රමාදයක් සිදුව ඇති බව පිළිගනිමි. |

## 3.4 දේශිය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| (අ) ලඟම පාසැල හොඳම පාසැල ව්‍යාපෘතියට යටතේ 2018 වර්ෂය සඳහා වෙන්කල, ඉල්ලුම් කල හා ලැබුණු ප්‍රතිපාදන පිළිවෙලින් රු.මිලියන 22.086, 34.542, 13.129 ක් බැවින්, සැලසුමට අනුව කටයුතු කර නොතිබුණි.<br><br>මධ්‍යම පළාතේ ඉදිකිරීම් කොන්ත්‍රාත් 04 කින් ඉදිරිපත් කර තිබූ රු.මිලියන 1.76 ක් වූ ලංසු ඇපකර හා කාර්යසාධන ඇපකර | | නිරීක්ෂණයේ සඳහන් පාසල්වල මෙකී අවශ්‍යතාවල ප්‍රමුඛතා කැඳවා තිබුනේ මුලින් සැලසුම් කල පරිදි ව්‍යාපාතියට තවදුරටත් මූල්‍ය ප්‍රතිපාදන ලදහොත් සලකා බැලීම සඳහා වුවත්, දෙවනුව විදුහල්පතිවරුන්ගේන් ලබාගත් ප්‍රමුඛතා සම්බන්ධයෙන් පියවර ගැනීමට නොහැකි වී ඇත. මුල් ප්‍රසම්පාදන සැලැස්මේ පාසල්වල අවශ්‍යතා තීරණය කරන ලද්දේද එවකට සිටි පළාත් අධ්‍යාපන |

02 ක් ව්‍යාජ ඒවා වූ අතර, රු.මිලියන 7.26 ක් වූ ඇපකර 02 ක කාලය දීර්ඝ කළ බවට ව්‍යාජ සහතික ඉදිරිපත් කර තිබුණි. ඉදිකිරීම් නවතා දැමූ හා භෞතික ප්‍රගතිය අවම මට්ටමක පැවති ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 73.01 ක් වූ ව්‍යාපෘති 02 කද වටිනාකම රු.මිලියන 7.14 ක් වූ ඉදිකිරීම් ප්‍රමිතියෙන් තොර වීම හා නුසුදුසු ස්ථානවල ඉදිකිරීම නිසා පැවැත්ම තර්ජනයට ලක්ව තිබුණි. වසර 03 කට පෙර ඉදිකල රු.මිලියන 38.16 ක්වූ හා ගොඩනැගිලිවලට අවශ්‍ය උපකරණ නොසැපයීම නිසා නිශ්ක්‍රීයව පැවතුණි.

බලධාරීන් හා විදුහල්පතිවරුන්ගෙන් අදහස් විමසීමෙන් පසුව වේ.

ජාතික පාසල්වල විදුහල්පතිවරුන්ට පැවැත්වෙන වැඩ මුළුවලදී ඔවුන්ගේ ආකල්ප කුසලතා වර්ධනයට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරමි.

වාර්ෂික පාසල් අධීක්ෂණ සැලැස්මක් සැකසීමෙන් අනතුරුව ඉටු කරනු ලබන අහඹු අධීක්ෂණයන් මගින් පාසල්වල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් විශේෂයෙන් සොයා බලනු ලැබේ.

**(ආ) සුරක්‍ෂා සිසු රක්‍ෂණාවරණය යටතේ**

අවුරුදු 5 සිට 19 දක්වා වයස් කාණ්ඩයේ පසුවන මිලියන 4.5 ක් වූ සිසුන් සඳහා සෑම සිසුවෙකුටම රුපියල් ලක්‍ෂ දෙකක ආවරණයක් වෙනුවෙන් 2017 සැප්තැම්බර් 07 දින අධ්‍යාපන අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාව අතර, මුල්වරට අත්සන් කර තිබුණු ගිවිසුම අනුව 2017 ඔක්තෝබර් 01 සිට 2018 සැප්තැම්බර් 30 දක්වා ගිවිසුම්ගත වටිනාකම බදු සහිතව රු. මිලියන 2,700 ක් විය. ගිවිසුම්ගත කාල සීමාව 2018 නොවැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණු අතර, 2017 නොවැම්බර් සිට 2018 නොවැම්බර් 30 දක්වා ගිවිසුම්ගත වටිනාකමින් සියයට 18.96 ක් පමණක් රක්‍ෂණ ප්‍රතිලාභ වශයෙන් සිසුන්ට ගෙවා තිබුණි.

සියළුම පාසැල් සිසුන්ට පහසුවෙන් රක්‍ෂණාවරණ ප්‍රතිලාභ ලබාගත හැකි වන වැඩ පිළිවෙලක් ඇති කළ යුතුය.

2017 ඔක්තෝම්බර් 01 දින සිට 2018 නොවැම්බර් 30 දින දක්වා රක්ෂණ හිමිකම් සඳහා ඉල්ලීම් 47,029 ක් ලැබී තිබුණු අතර, ඉන් 40,978 ක් සඳහා ප්‍රතිලාභ වශයෙන් රු.මිලියන 512.16 ක් ගෙවා තිබුණි. 2018.12.01 දින සිට 2019.11.30 දින දක්වා සුරක්ෂා සිසු රක්ෂණාවරණය සඳහා ගිවිසුම අලියාන්ස් ලංකා පුද්ගලික සමාගම සමඟ 2019.04.03 දින අත්සන් කර ඇත.

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්‍ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්‍ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ ප්‍රසම්පාදන සැලසුමේ සඳහන් වටිනාකමින් සියයට 79.45 ක් වූ රු. මිලියන 14,152.6 ක් වටිනා අයිතම් 35 ක් සම්පූර්ණ කර නොතිබුණු අතර, රු. මිලියන 204.2 ක් වටිනා අයිතම් 10 ක් අවලංගු කර තිබුණි. | වර්ෂය තුළ නිම කිරීමට අපේක්‍ෂිත කාර්යයන් සැලසුම් කර නිශ්චිත කාල වකවානු තුළදී නිමා කර අපේක්‍ෂිත භෞතික ප්‍රගතිය හා ඵලදායිත්වය ලබාගැනීමට කටයුතු කළ යුතුය | පිළිතුරු ලබාදී නැත. |
| (ආ) | ජාතික පාසැල් සඳහා විදුහල්පතිවරුන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්‍ෂණය පවත්වා තිබුණු අතර, අධ්‍යාපන අමාත්‍යාංශ අංක දරන 23/2011 චක්‍රලේඛයේවිධිවිධාන පරිදි කටයුතු නොකිරීම හේතුවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටු ලේකම්ගේ ලිපියකින් අවලංගු කර තිබුණි. ඒ අනුව ඒ සඳහා වැය කල රු. 1,153,655 ක මුදල අනාර්ථික වියදමක් වී තිබුණි. | ජාතික පාසැල් විදුහල්පතිවරුන් නිශ්චිතව පත්කිරීමට හා වසර ගණනාවක සිටම නොවිසඳුන විදුහල්පති පුරප්පාඩු පිරවීමට කඩිනම් අවධානය යොමු කළයුතුය | සම්මුඛ පරීක්ෂණ සඳහා දැන්වීම්, ආහාරපාන හා දීමනා වශයෙන් රු. 736,000 ක් වැය කර ඇත. 2018 වර්ෂයේ සම්මුඛ පරීක්ෂණවලදී ඉංග්‍රීසි හා තාක්ෂණ විෂය හැකියාව අවධානයට ලක් කර ඇත. 3 පන්තියේ නිලධාරීන් 1,918 ක් බඳවා ගැනීමට කටයුතු කර ඇති අතර, ව්‍යවස්ථා විධිවිධාන අනුව උසස්වීම් සිදුකිරීමට කටයුතු කරනු ඇත. භාෂා ප්‍රවීනතාවය සම්පූර්ණ නොකිරීම හේතුවෙන් II ශ්‍රේණියෙන් I ශ්‍රේණියට උසස්වීම් කිරීමට නොහැකි වී ඇත. |
| (ඇ) | 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් 11 දෙනෙකු සංචිත ඒකකය වෙත අනුයුක්ත කර තිබුණු නමුත්, ඔවුන්ට අදාළ විනය පරීක්‍ෂණ අවසන් කිරීමට පියවර ගෙන නොතිබුණි. ඒ වන විට අධ්‍යාපන පරිපාලන සේවයේ තනතුරුවල පුරප්පාඩු 10 ක් පැවතුණි. | විධිමත්ව විනය හා විමර්ශන කටයුතු සිදුකර අවසාන කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු අතර, එම තනතුරුවල පවතින පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළයුතුය | 2015 සිට 2018 දෙසැම්බර් දක්වා කාලය තුළ අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු 10ක් පුරප්පාඩු වී ඇති අතර, එම තනතුරු සඳහා ඉදිරියේ දී විධිමත්ව නිලධාරීන් පත්කිරීමට නියමිතය. |

## (ඇ) සිසුන් ඇතුළත් කිරීම්

---------------------

| | | |
|---|---|---|
| i. වෘත්තිකයින්ගේ හෝ නිලධාරීන්ගේ දරුවන්ව ජනප්‍රිය පාසැල්වලට ඇතුළත් කිරීම සම්බන්ධ නිශ්චිත නිර්නායක, ක්‍රමවේද හෝ උපදෙස් නොතිබුණි. ඇතැම් වෘත්තිකයින් හා නිලධාරීන් සඳහා පමණක් ඒ සඳහා අවස්ථාව ලැබී තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් පොදු ප්‍රතිපත්තියක් හඳුන්වාදී නොතිබුණි. | පාසැල්වලට සිසුන් ඇතුළත් කිරීම සඳහා පොදු ක්‍රම වේදයක් හා ප්‍රතිපත්තියක් සැලසීම තුළින් සියළු සිසුන්ට සම අවස්ථා නිර්මාණය කළයුතුය | අධ්‍යාපන අමාත්‍යතුමාගේ විශේෂ අනුමැතියක් යටතේ (ස්ථාන මාරු පදනම මත) විවිධ වෘත්තිකයන් සඳහා අනුමත නිර්නායකයන් පදනම් කරගෙන ජනප්‍රිය පාසල්වලට සිසුන් ඇතුළත් කරනු ලැබේ. එමගින් පාසල්වලට සීමාව ඉක්මවා සිසුන් ඇතුළත් කිරීමට සිදුවන බව විශේෂයෙන් සඳහන් කරමි. ඉදිරියේ දී මේ සඳහා පොදු චක්‍රලේඛයක් සකස් කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුකරනු ඇත. |
| ii. අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2008 සැප්තැම්බර් 19 දිනැති අංක 2008/37 දරන චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, ජාතික පාසැලක ප්‍රාථමික ශ්‍රේණිවල සමාන්තර පන්තියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 40 ක් හා ද්විතීයික ශ්‍රේණිවල සමාන්තර පන්තියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 45 ක් යන සීමාවන් සඳහන් කර තිබුණු අතර, 2016 මැයි 16 දිනැති අංක 17/2016 දරන සංශෝධිත චක්‍රලේඛයේ 3.1 අනුව පලමු ශ්‍රේණියට ළමුන් ඇතුලත් කිරීමේදී පන්තියක් සඳහා තෝරාගත යුතු මුළු සිසුන් සංඛ්‍යාව 39 ක් ලෙස දක්වා තිබුණි. සෝදිසි පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ පරිදි මෙම සීමාවන් ඉක්මවා, 2017 වර්ෂයේදී ජාතික පාසැල් 109 ක 6,337 ක් හා 2018 වර්ෂයේදී පාසැල් 73 ක 3,339 ක් සිසුන් ඇතුලත් කර තිබුණි. | පාසැල්වල පවතින පහසුකම් අභිබවා සහ චක්‍රලේඛ උපදෙස්වල සඳහන් සීමාවන් ඉක්මවා අතරමැදි ශ්‍රේණිවලට සිසුන් ඇතුළත් කිරීමට ඇති ඉඩකඩ අවම කිරීම සඳහා අවශ්‍ය පියවර ගතයුතුය. | ජාතික පාසල්වල අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීමට කරනු ලබන ඉල්ලීම් එම පාසල්වල විදුහල්පතිවරුන් වෙත යොමු කොට 1,5,6 හැර අතරමැදි ශ්‍රේණිවල පවතින පුරප්පාඩු අනුව 2008/37 චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීම සාමාන්‍ය ක්‍රමවේදය වේ. අධ්‍යාපන අමාත්‍යතුමාගේ විශේෂ අනුමැතියක් යටතේ (ස්ථාන මාරු පදනම මත) විවිධ වෘත්තිකයන් සඳහා අනුමත නිර්නායකයන් පදනම් කරගෙන ජනප්‍රිය පාසල්වලට සිසුන් ඇතුළත් කරනු ලැබේ. එමගින් පාසල්වලට සීමාව ඉක්මවා සිසුන් ඇතුළත් කිරීමට සිදුවන බව විශේෂයෙන් සඳහන් කරමි. 2019 වර්ෂයේ අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීම අධ්‍යාපන අමාත්‍යතුමාගේ නියෝගය මත තාවකාලිකව අත්හිටුවීමටද කටයුතු කර ඇත. |
| iii. | | |

| | | | |
|---|---|---|---|
| **(ඉ)** | කායික හා මානසික සමබරතාවයෙන් යුතු නිරෝගී පරපුරක් දැයට දයාද කිරීම ක්‍රීඩා දක්‍ෂතා සහිත සිසුන් දක්‍ෂ ක්‍රීඩකයින් බවට පත්කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ව්‍යාපෘති යෝජනාවක් අනුව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ හා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. සිසුන්ගේ ශාරීරික යෝග්‍යතාවය දියුණු කිරීම සඳහා අරමුණු 7 ක් මුල් කරගෙන 2016 සිට ඉදිරි වර්ෂ 5 ක් තුල ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 18,394.5 ක් ඇස්තමේන්තු කර තිබුණි. 2016 වර්ෂයේදී මෙම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණු අතර, 2017 වර්ෂය සඳහා රු. මිලියන 250 ක ප්‍රතිපාදනද, 2018 වර්ෂය සඳහා රු.මිලියන 300 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. 2018 ට ලැබී තිබුණු රු.මිලියන 300 න් රු. මිලියන 99 ක් පමණක් වැයකර තිබුණි | ජාතික අවශ්‍යතාවයක් ලෙස සලකමින්, කායික හා මානසික සමබර අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපිත කිරීම වෙනුවෙන් සියළු සිසුන්ගේ ශාරීරික යෝග්‍යතාවය දියුණු කිරීම සඳහා අරමුණු ගත පරිදි කටයුතු කළයුතුය. | ක්‍රීඩා සංවර්ධන වැඩසටහන පිළිබඳ 2019 – 2025 දක්වා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඉදිරිපත් කිරීම. ක්‍රීඩා පාසල්හී විදුහල්පතිවරුන් සමග උපදේශකයින් කැදවා ඒවායේ ක්‍රියාකාරිත්වය හා අඩුපාඩු සම්බන්ධයෙන් නිවරදි වාර්තාවක් ලබා දීම. සියළුම පාසල් වල ක්‍රීඩා සම්බන්ධව අවශ්‍යතා සම්බන්ධයෙන් තොරතුරු ගොනුවක් සකස් කර ඉදිරිපත් කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ජාතික පාසැල් 112 ක හා පළාත් පාසැල් 704 ක පවතින විශේෂ අධ්‍යාපන ඒකක තුල සිසුන් 10,284 ක් ඉගෙනුම ලබන අතර, එම ඒකක තුළ ගුරුභවතුන් 1,189 කගේ හා පළාත් නවයට අදාළව ගුරුභවතුන් 597 කගේ පුරප්පාඩු පැවතුණි. වෙනත් විෂයයන්ට පත්වීම් ලද 158 දෙනෙකු උගන්වනු ලබන අතර, විශේෂ අධ්‍යාපන ඒකකවලට අදාලව පත්වීම් ලද 189 ක් විශේෂ ඒකක නොමැති පාසැල්වලටද, 54 දෙනෙකු විශේෂ ඒකක තිබුණද වෙනත් පන්තිවලටද අනුයුක්ත කර තිබුණි. රත්නපුර ජේසු බිළිඳාගේ කන්‍යාරාමය ජාතික පාසලේ ඌනතා සහිත සිසුන් 98 දෙනෙකු සිටියද පාසලේ විශේෂ අධ්‍යාපන ඒකකයක් පිහිටුවා නොතිබුණු අතර, විශේෂ අධ්‍යාපනය සඳහා සිටින එකම ගුරුභවතාද ඇඹිලිපිටිය මධ්‍ය මහාවිද්‍යාලය වෙත අනුයුක්ත කර තිබුණි. | විශේෂ අධ්‍යාපන ඒකක තුල අධ්‍යාපනය ලබන විශේෂ අවශ්‍යතා සහිත සිසුන් වෙත ඉගැන්වීම සඳහා විශේෂිත වූ පුහුණුව ලද ගුරුභවතුන් ප්‍රමාණවත්ව යෙදවීමට කටයුතු කළයුතුය | පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ඉල්ලා ඇත. 2012 නොවැම්බර් 23 දිනැති අංක 42/2012 දරන චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු නොකරන ගුරුභවතුන්ගේ වැටුප් වර්ධක නතර කිරීමටත්, 2017 මැයි 17 දිනැති අංක ED/9/18/8/2/6 දරන අධ්‍යාපන ලේකම්ගේ ලිපියේ උපදෙස් පරිදි කටයුතු කිරීමටත් පියවර ගෙන ඇත. රත්නපුර ජේසු බිළිඳාගේ කණ්‍යාරාමය ජාතික පාසලේ විශේෂ අධ්‍යාපන ඒකකයක් පිහිටුවා නොමැත. |

**(උ) ජාතික පාසැල් කටයුතු**

----------------------

| | | | |
|---|---|---|---|
| i. | ජාතික පාසැල් 113 ක විෂයයන් 1,069 ක් වෙනුවෙන් පැවති ගුරු ඌණතාවයන් 1,359 ක් හා විෂයයන් 584 ක් වෙනුවෙන් පැවති ගුරු අතිරික්තතාවයන් 898 ක් අවම කිරීමට කටයුතු කර නොතිබුණි. ජාතික පාසැල් 115 ක වර්ෂ 8 ඉක්මවන ලද ගුරුභවතුන් 2,276 ක් විය. | ගුරු ඌණතා සහ අතිරික්තතා අවම කිරීමට කටයුතු කළයුතු අතර, වාර්ෂික ස්ථානමාරු ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.<br><br>විශේෂිත වූ විෂයයන් සඳහා පත්වීම් ලද ගුරුභවතුන් වෙත එම විෂයයන් පැවරීම හා ප්‍රාථමික පුහුණුව ලද ගුරුභවතුන් එම ශ්‍රේණි සඳහා අනුයුක්ත කළයුතුය. | ගුරුවරුන් බඳවා ගැනීමේදී ඇති වී තිබෙන ගැටළු, නව විෂයයන්ට අදාල ගුරුභවතුන් ලබා දීමේ අපහසුතා හා නවක ගුරුවරුන් බඳවා ගැනීමේදී ඇතැම් විෂයයන්ට ප්‍රමාණවත් ගුරුවරුන් නොසිටීම නිසා පාසල් වල ගුරු ඌණතාවයන් හා අතිරික්ත වීම් ඇත. 2020 වසරේ සිට විෂයයන් අනුව ගලපා ස්ථාන මාරු කිරීමට නියමිතය. |
| ii. | ජාතික පාසැල් 118 කින් | පාසැල් වෙත ප්‍රමාණවත් | ඇතැම් ජාතික පාසල් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් |

107 ක ගුරුභවතුන් 601 දෙනෙකු වෙත පත්වීම් ලද විෂයට පරිබාහිර විෂයන් ලබාදී තිබුණු අතර, පාසැල් 21 ක ප්‍රාථමික ශ්‍රේණිවලට ප්‍රාථමික ගුරු පුහුණුව නොලත් ගුරුභවතුන් 44 දෙනෙකු අනුයුක්ත කර තිබුණි.

iii. නියෝජ්‍ය හා සහකාර විදුහල්පතිවරු හා ගුරුභවතුන් සඳහා සතියකට වෙන්කල යුතු කාල පරිච්ඡේද සංඛ්‍යාව පිළිවෙලින් 10 ක් 12 ක් හා 35 ක් විය යුතු වුවද, 2018 වර්ෂයේදී පමණක් කිසිදු කාර්යයන් පවරා නොතිබූ ගුරුභවතුන් සංඛ්‍යාව පිළිවෙලින් 139 ක්, 42 ක් හා 549 ක් විය.

iv. ජාතික පාසැල් 118 කින් පාසැල් 30 ක පාසැල් සංවර්ධන සමිතියෙන් වැටුප් ගෙවමින් අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 90 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර, 2018 වර්ෂයේදී ඔවුන් වෙත ගෙවා තිබුණු මුළු මුදල රු.මිලියන 11.78ක් විය.

v. ජාතික පාසැල් 118 කින් 102 ක අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 1,034 ක ඌණතාවයක් පැවතුණි.

අවම ශිෂ්‍ය සංඛ්‍යාවක් පවතින සැලකිය යුතු ජාතික පාසැල් ප්‍රමාණයක් පැවතුණි

vi. ජාතික පාසැල් 118 කින් 42 ක පමණක් 2018 දෙසැම්බර් 31 දිනට

අනධ්‍යයන කාර්ය මණ්ඩලයක් ලබාදීමට කටයුතු කළයුතු අතර, එම කාර්ය මණ්ඩලය උපරිම අයුරින් සේවයේ යෙදවීමට කටයුතු කළයුතුය.

යොදවා ඇති අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බැවින් පාසල් සංවර්ධන සමිතිය මඟින් වැටුප් ගෙවීමේ පදනම මත සේවය ලබාගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අනුමැතිය ලබාදේ.

ජාතික පාසල් විදුහල්පති කණ්ඩායම් වශයෙන් කැඳවා මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් උපදෙස් දෙන ලදී.

නියෝජ්‍ය විදුහල්පතිවරුන් සඳහා ඉගැන්වීම් පිළිබඳ කාලපරිච්ඡේද සම්බන්ධයෙන් 2018 ජූනි මස .22,25,28 සහ ජූලි මස 02 දිනයන්හි දී පවත්වන ලද අධ්‍යයන කාර්ය මණ්ඩලය නිර්ණය කිරීමේ වැඩමුළුවේදී සියලුම ජාතික පාසල්වල විදුහල්පතිවරුන් දැනුවත් කර ඇත.

| | | | |
|---|---|---|---|
| | ස්ථාවර තැන්පත්වල රු.මිලියන 149.25 ක් ආයෝජනය කර තිබුණි . | | |
| (ඌ) | පාසැල් ඉදිකිරීම් සඳහා එකම කොන්ත්‍රාත්කරුවන් කණ්ඩායමක් තෝරාගැනීම හේතුවෙන් එම පාසැල් රු.මිලියන 106.6 ක ඉදිකිරීම්වල අසාමාන්‍ය ප්‍රමාදයන් හා අඩුපාඩු පවතින බව නිරීක්ෂණය විය. | එකම කොන්ත්‍රාත්කරුවෙකුට විශාල ඉදිකිරීම් සංඛ්‍යාවක් පැවරීමට නොකළ යුතු අතර, කාල පරිච්ඡේදයන් තුල කොන්ත්‍රාත් පැවරීම හා සැලසුම් අනුව කටයුතු කිරීම පිළිබඳව අධීක්ෂණය කළයුතුය | රත්නපුර සීවලී විද්‍යාලයේ ඉදිකිරීම්වල ප්‍රසම්පාදනය සඳහා වග වන, සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් විමසා ඇති අතර, ලබාදුන් පිළිතුර සම්පූර්ණ කර නැවත එවන ලෙස දන්වන ලදී.<br><br>සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සාකච්ඡාවක් සඳහා අමාත්‍යාංශය වෙත කැඳවීමට ද තීරණය කරන ලදී. |
| (එ) | පසුගිය වර්ෂ කිහිපය තුල තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ විෂය සඳහා පෙනී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් තුනෙන් එකකට ආසන්න සංඛ්‍යාවක් අසමත් වී තිබුණි. විභාග දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අනුව, 2017 වර්ෂයේදී උසස් පෙළ විෂයයන් ලෙස භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, සංයුක්ත ගණිතය, තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය හා තාක්‍ෂණය සඳහා විද්‍යාව හැදෑරූ සිසුන්ගෙන්ද 1/3 කට ආසන්න ප්‍රමාණයක් අසමත්ව තිබුණි. එසේ වුවද, ඒ සඳහා හේතුවී තිබුණු කරුණු හඳුනාගැනීමට සහ ඒ සඳහා පිළියම් යෙදීමට සුදුසු විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වී නොතිබුණි. ඉංග්‍රීසි සාහිත්‍ය, ප්‍රංශ, රුසියානු හා ජපන් භාෂා ගුරුවරුන්ගේ ගුරු පුරප්පාඩු 52 ක් වූ අතර, රුසියානු හා ජපන් භාෂා සඳහා පසුගිය වසර පහක කාලය තුල ගුරුභවතුන් බඳවාගෙන නොතිබුණි. 2014 වසරේ සිට 2018 වසර දක්වා ඉංග්‍රීසි සාහිත්‍ය ගුරුවරුන්ට පුහුණු වැඩසටහන් පවත්වා නොතිබුණි. ගුරු පුරප්පාඩු පැවතීමත් හා ගුරු | සමස්ථ ප්‍රතිඵල ඇගයීම තුලින් ව්‍යුහය තුල පවතින අඩුපාඩු හඳුනාගෙන නිසි අධ්‍යයනයකින් පසුව ඒ ඒ නිවැරදි කිරීමට අවශ්‍ය පිළියම් යෙදිය යුතුය. විෂයයන් ඉගැන්වීම සඳහා ප්‍රමාණවත් ගුරුවරුන් සංඛ්‍යාවක් අනුයුක්ත කිරීම, අවශ්‍ය පරිදි ගුරු පුහුණුව ලබාදීම හා විෂ්‍ය ඉගැන්වීම් පිළිබඳව අධීක්ෂණය කිරීම තුලින් විෂය ගැටළු හඳුනාගෙන ඒ අනුව ගුණාත්මක විෂය ඉගැන්වීමක් සිදුකෙරෙන බව තහවුරු කරගැනීමට අවශ්‍ය පිළියම් යෙදිය යුතුය. | 2017 වර්ෂයේ භෞතික විද්‍යාව විෂය අසමත් සිසුන් ප්‍රමාණය 32.64%, රසායන විද්‍යාව විෂය අසමත් සිසුන් ප්‍රමාණය 30.83%, සංයුක්ත ගණිතය අසමත් සිසුන් ප්‍රමාණය 33.94%, තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය අසමත් සිසුන් ප්‍රමාණය 33.45% හා තාක්ෂණය සඳහා විද්‍යාව අසමත් සිසුන් ප්‍රමාණය 29.67% ක් විය.<br><br>අසමත් වීමේ ප්‍රතිශතයන් සලකා බලා එක් එක් විෂයය කොටස් පිළිබඳව කටයුතු කිරීම අදාල නිලධාරීන් විසින් සිදු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | පුහුණු වැඩසටහන් නොපැවැත්වීමත් සිසුන්ගේ අධ්‍යයන මට්ටමේ පසුබෑමට හේතු වී තිබුණි. | | |
| **(ඒ)** | දිවයිනෙහි පවතින පාසැල් සංඛ්‍යාව වන 10,162 කින් ස්ථිර පුස්තකාල පහසුකම් පාසැල් 3,499 කද පවතින කියවීම් කාමර 2,185 ක් සහ තාවකාලික පුස්තකාල 3,314 ක් විය. පාසැල් සියයට 34 කට පමණක් ස්ථිර පුස්තකාල පැවතුණ අතර, පාසැල් 1,164 කට පුස්තකාල හෝ ඒ හා සමාන කියවීමේ ඉඩකඩක් හෝ නොපැවතුණි.<br>අමාත්‍යාංශය විසින් අදියර 3 ක් යටතේ 2018 වර්ෂයේදී රු.මිලියන 3.63 ක් වැයකර පළාත් 9 හි කලාප 98 ක පුස්තකාල විෂය භාර අධ්‍යක්ෂවරු 80 දෙනෙක් පුහුණු කර තිබුණද, මෙම පුහුණුවේ ඵලදායීත්වය පළාත් නිලධාරීන් හරහා පාසැල් වෙත විහිද ගොස් නොතිබුණි.<br>පාසැල්වල සේවා නියුක්ත පුස්තකාලාධිපතිවරුන් 2,607 කින් 1,906 දෙනෙකු පුස්තකාලාධිපති තනතුර සඳහා කිසිදු සුදුසුකමක් ලද අය නොවිය. | සියළු සිසුන් වෙත පුස්තකාල පහසුකම් වැඩි දියුණු කිරීමටත් සුදුසුකම් ලත් නිලධාරීන් පුස්තකාල සඳහා අනුයුක්ත කිරීමටත් කටයුතු කළයුතුය | (අ) ශිෂ්‍ය සංඛ්‍යාවෙන් අඩු කුඩා පාසල් වලටද පන්ති පුස්තකාල, පුස්තකාල කබඩ්, පොත් පෙට්ටි වැනි විවිධ කියවීම් ක්‍රමවේද හඳුන්වා දී ඇත. දිවයිනේ සෑම පාසලකම කියවීම සඳහා වූ පොත් ප්‍රමාණයක් පවත්වා ගෙන යනු ලබයි.<br>ආ) නිලධාරීන් සඳහා වූ පුහුණු කිරීම්වල ප්‍රතිඵල ඊට පහළ ස්ථරයන්ට කාන්දු වීම සිදු වනුයේ පළාත් මට්ටමින් සිදු කරනු ලබන වැඩමුළු සහ ස්ථානීය පරීක්ෂණවලදී ය. මේ සඳහා කිසියම් කාලයක් ගත වනු ඇත.<br>(ඇ) නව බඳවා ගැනීම් සමඟ ඔබ විසින් පෙන්වා දෙන කරුණ නිවැරදි වනු ඇත. |
| **(ඔ)** | 2001 වර්ෂයේ ආරම්භ කර තිබුණු සිසු අරුණ අධ්‍යාපනික අරමුදලේ අරමුණු අනුව වටිනාකම රු. මිලියන 2.5 ක් සම්පූර්ණ වන විට ශිෂ්‍යත්ව ලබාදීමට කටයුතු කල යුතුය. 2015 වර්ෂය අවසාන වන විටදී රු. මිලියන 2.6 ක් වූ අතර, 2018 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 4.4 ක් ඉක්මවා තිබුණු නමුත්, මුදලක් අරමුදලේ පැවතියද, ශිෂ්‍යාධාර පිරිනැමීමට 2019 දක්වා කටයුතු කර නොතිබුණි.<br>අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ අධීක්ෂණයක් නොතිබුණු බැවින් | අරමුදලෙන් අපේක්ෂිත මූලික අරමුණ වන ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා අවශ්‍ය කටයුතු සැලසිය යුතුය | සමාගම් නාමය කපාහැර ඇති බැවින් ඊට අදාළ දේපළ හා අයිතිවාසිකම් මහා භාණ්ඩාගාරය වෙත පැවරී ඇත.<br>ඒ පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුව විමසීමේදී අදාළ අධිකාරීන් සමඟ කටයුතු කර උක්ත සමාගම නැවත පිහිටුවීම හෝ අදාළ විෂය පථයට මුදල් නිදහස් කිරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම් විමසන ලෙස උපදෙස් ලබා දී ඇත. එම කාර්යයන් සඳහා වෙනම අයවැය ප්‍රතිපාදන වෙන් කරවා ගෙන ජාතික අයවැය තුල තවදුරටත් |

| | | | |
|---|---|---|---|
| | සිසු එම සමාගම් නාමය කපාහැර තිබුණි. | | ඉදිරියට කරගෙන යාම සුදුසු බවට නිරීක්ෂණ ලබා දී ඇත.<br><br>ඒ අනුව මෙම අරමුදල මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට බැර කර අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන වෙනත් ශිෂ්‍යාධාර වැඩසටහනක් සඳහා මුදල් නිදහස් කරන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදී. |
| **(ඕ)** | ගුරු තොරතුරු ඇතුළත් දත්ත සංචිතයක් (Data Base) පිළියෙල කරගැනීමට මොරටුව විශ්ව විද්‍යාලයේ සහයෝගය ඇතිව අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියක් (EMIS) ස්ථාපිත කර තිබුණු අතර, ඒ සඳහා 2011 මාර්තු මාසයේ සිට 2014 දෙසැම්බර් 31 දක්වා වූ කාලය තුළදී දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘති (EKSP) අරමුදලින් වැය කර තිබුණු මුදල රු.මිලියන 64.06 ක් විය.<br><br>මොරටුව විශ්ව විද්‍යාලයට රු.මිලියන 14.78 ක් ගෙවා තිබුණද, එම පද්ධතිය ඵලදායී ලෙස උපයෝජනය කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් නොහැකි වී තිබුණි. | 2011 වර්ෂයේ සිටම කටයුතු කරන ගුරු තොරතුරු හා ශිෂ්‍ය තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සැකසීමේ කටයුතු කඩිනමින් නිම කළ යුතුය | ගුරුභවතුන් සඳහා වන මානව සම්පත් කළමනාකරණ පද්ධතිය වෙත සියළුම ගුරුවරුන්ගේ, පිරිවෙන් ගුරුවරුන්ගේ ගුරුසහයකවරුන්ගේ, දත්ත ඇතුළත් කර ඇත.<br><br>මෙම පද්ධතිය එදිනෙදා භාවිතය සඳහා විධිමත් කිරීම සඳහා වන චක්‍රලේඛය හා උපදෙස් සංග්‍රහය නිකුත් කිරීමට අපේක්ෂිතය. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් දැනුවත් වී තිබුණු නමුත්, එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවීමේ වැඩ පිළිවෙල සැලසුම්වලට ඇතුළත් කර එම ඉලක්ක කරා ළඟ විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු | 2030 වර්ෂයේදී ළඟා කරගත යුතුව ඇති අධ්‍යාපනය සම්බන්ධ වූ තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීමට අවශ්‍ය සැලසුම් සකස් කර එය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමට කටයුතු කළයුතුය | අදහස් දක්වා නැත |

කර නොතිබුණි.

**5. යහපාලනය**

**-------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| **(අ) විනය හා විමර්ශන සම්බන්ධ කාර්යසාධනය** | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට විසඳා අවසන් නොවූ විනය ගැටළු 333 ක්වූ අතර, ඉන් 16 න් විද්‍යාපීඨවලටද, 20 ක් අමාත්‍යාංශයටද, 59 ක් කොළඹ දිස්ත්‍රික්ක පාසැල්වලටද, අදාළ ඒවා විය. මෙම ගැටළුවලින් 09 ක් වර්ෂ 7 ක්ද, 30 ක් වර්ෂ 05 ක්ද, 128 න් වර්ෂ 2 ත් 5 ත් කාලයක්ද ඉක්මවා තිබුණි. ළමා අපචාර පරීක්ෂණ 19 ක්ද, මූල්‍ය අක්‍රමිකතා පරීක්ෂණ 42 ක්ද, පාසැල් ළමුන් ඇතුළත් කිරීමේ පරීක්ෂණ 62 ක්ද විය. මෙම ගැටළු අප්‍රමාදව විසඳා නැවත ඇතිවීමට ඇති අවධානම මඟ හරවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | ඉතා විශාල වශයෙන් එකතුවෙමින් පවතින විනය ගැටළු විසඳා අවසන් කරගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. | අමාත්‍යාංශය, ජාතික පාසල්, විද්‍යාපීඨ යන ආයතනවලට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට විසඳා අවසන් කර නොතිබුණු විනය ගැටළු සංඛ්‍යාව 397 කි. 2018.12.31 දින වන විට අවසන් නොවූ ගොනුවලින් 2019.04.30 දින වන විට පවතින්නේ ගොනු 333 ක් පමණකි.<br>ඉහත ගැටළු අතර විද්‍යාපීඨවලට අදාල විසඳා අවසන් නොවූ ගැටළු සංඛ්‍යාව 16 කි. කොළඹ දිස්ත්‍රික්කයේ පාසල්වලට අදාළ පරීක්ෂණ සංඛ්‍යාව 77ක් වේ. 2019.04.30 දිනට ඉන් ගොනු 59 ක් පවතින අතර අධ්‍යාපන අමාත්‍යාංශට අදාල ගොනු සංඛ්‍යාව 20 කි. |
| **(ආ)** අධ්‍යාපන අමාත්‍යාංශයන් සේවා ඉටුකිරීමේදී මතුවී තිබෙන ගැටළුකාරී තත්ත්වයන් සම්බන්ධයෙන් 2016, 2017 සහ 2018 යන වර්ෂවලදී මහජන නියෝජන පිළිවෙලින් 133 ක්, 131 ක් හා 110 ක් ලැබී තිබුණි. නිති රීති රෙගුලාසි උල්ලංඝනය කිරීම්, මූල්‍ය හා පරිපාලන අක්‍රමිකතා හා සිසුන් ඇතුළත් කිරීම්වලට අදාල මහජන නියෝජන වැඩි ප්‍රමාණයක් මේ අතර තිබුණි. | මූල්‍ය, පරිපාලන හා විනය කටයුතු සම්බන්ධයෙන් විගණනය වෙත ඉදිරිපත් කෙරෙන නියෝජන ප්‍රමාණය අවම කරගැනීම සඳහා ළියම් යෙදිය යුතුය | මහජනයා වෙත සේවා ඉටු කිරීම ක්‍රමවත්ව පැවැත්වීම සඳහා පරිගණක පද්ධතිය වඩාත් කාර්යක්ෂම ලෙස භාවිතා කිරීමට විෂය අධ්‍යක්ෂවරුන් සහ මාණ්ඩලික නිලධාරින් සඳහා දැණුවත් කිරීමේ වැඩමුළු පවත්වා ඇත.<br><br>මහජන දිනය සම්බන්ධව ඉදිරිපත් කර තිබූ ගැටළු පිළිබඳව අමාත්‍යාංශයේ සියලුම අංශ දැනුවත් කර එහිදි ගත යුතු ඉදිරි පියවර පිළිබඳව වැඩිදුරටත් පැහැදිලි කර ඇත. |

**6. මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට යාවත්කාලීන කරන ලද කාර්ය මණ්ඩල තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශය සතුව විධිමත් ලෙස සකස් කර යාවත්කාලීන කරමින් පවත්වාගෙන යනු ලබන දත්ත පද්ධතියක් පවතින බවට සාක්ෂි විගණනයේදී නිරීක්ෂණය නොවීය. | අමාත්‍යාංශයට අදාළ සමස්ථ කාර්ය මණ්ඩල තොරතුරු නිවැරදිව යාවත්කාලීන කර වාර්ෂිකව විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතුය. | 2018.12.31 දිනට යාවත්කාලීන කරන ලද අමාත්‍යාංශයේ සේවයේ නියුතු සියළුම කාර්ය මණ්ඩලය පිළිබඳව තොරතුරු අමුණා ඇත. |